(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 169.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2017 මැයි මස 26 වැනි සිකුරාදා පූ. භා. 10.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

903/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවක සංඛ්‍යාවට (cadre) අනුව අධිකාරියේ ස්ථිර තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් තනතුරු කවරේද;

(iii) දැනට වැඩ බලන තත්ත්වයේ පවතින තනතුරු සංඛ්‍යාව කොපමණද;

(iv) එම තනතුරු කවරේද;

(v) වැඩබලන තනතුරු සඳහා ස්ථිර නිලධාරින් බඳවා ගැනීමට කටයුතු නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

976/'16

ගරු බිමල් රත්නායක මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වයඹ පළාතේ, හලාවත, ඉරණවිල ප්‍රදේශයේ "ඇමරිකන් හඬ" (Voice of America) යනුවෙන් සම්ප්‍රේෂණාගාරයක් තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම ලබා දී ඇත්තේ සින්නක්කරද; එසේ නැතහොත්, බදු පදනම මතද;

(iv) බදු පදනම මත නම්, ශ්‍රී ලංකා රජයට ලබාදී ඇති බදු ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මෙම භූමිය තුළ ශ්‍රී ලංකා රජයේ සියලුම නීති රීති බලාත්මකවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "ඇමරිකන් හඬ" ආයතනය ආරම්භ කිරීමට ශ්‍රී ලංකා රජය සහ ඇමරිකා එක්සත් ජනපද රජය හෝ "Voice of America" ආයතනය සමඟ එළඹි ගිවිසුම් කවරේද;

(ii) එම ගිවිසුම් සියල්ලම සභාගත කරන්නේද;

(iii) එම ආයතනය තුළ සේවය කරන ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ආයතනය විසින් කරනු ලබන වැඩකටයුතු සහ විකාශනය කරනු ලබන වැඩසටහන් කවරේද;

(v) එම වැඩකටයුතු හා වැඩසටහන් නියාමනය කරනු ලබන රාජ්‍ය ආයතනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1008/’16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික ආරක්ෂාවට සහ ප්‍රජාතන්ත්‍රවාදයට අනතුරක් බැවින්, ප්‍රමුඛතා පදනමින් විමර්ශනය කරන මෙන් ඉල්ලමින් එවකට විදේශ අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා විසින් 2015.01.08 වැනි දින රාත්‍රියේ ජනාධිපතිවරණ ප්‍රතිඵල අත්හිටුවීමේ කුමන්ත්‍රණයක් පිළිබඳව, 2015.01.14 වැනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවත්;

(ii) ඒ පිළිබඳව මවිසින් ඉදිරිපත් කළ පාර්ලිමේන්තු වාචික ප්‍රශ්නයකට 2016.03.09 වැනි දින පිළිතුරු දෙමින් නීතිය සහ සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යවරයා විසින් නීතිපති උපදෙස් නොලැබීමෙන් ඉදිරි කටයුතු ඇණහිට ඇතැයි පැවසූ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එකී විමර්ශනය පිළිබඳ වාර්තාවක් නීතිපතිවරයාට ලැබුණු දිනය කවරේද;

(ii) එකී විමර්ශනය පිළිබඳ නීතිපති උපදෙස් පොලීසියට යැවූ දිනය කවරේද;

(iii) නීතිපති උපදෙස් මේ වනතෙක් යවා නොමැති නම්, ඊට බල පෑ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1167/’16

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය රජය යටතේ ආරම්භ කරන ලද මහනුවර නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂය අවසන් වනවිට නාගරික සංවර්ධන අධිකාරිය විසින් වැය කර තිබූ මුදල කොපමණද;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා පසුගිය රජය සමයේ විදේශ ආධාර හරහා වෙන් කළ මුදලින් ඒ වනවිට ලැබී තිබූ ප්‍රමාණය කොපමණද;

(iii) යහපාලන රජය බලයට පත් වී මාස 20ක පමණ කාලයක් ගත වී ඇතත්, එම කාලය තුළ මෙම ව්‍යාපෘතියේ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු වී නැති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරයක් වන මහනුවර වැනි නගරයක, නගර සංවර්ධන ව්‍යාපෘතියක් අත්හිටුවීමට අමාත්‍යාංශය කටයුතු කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1260/’16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබූ පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොලිස් ස්ථානයන්හි සේවය කරන ලද පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983 න් පසුව 2009 වර්ෂයේ යුද්ධය අවසන් වනතෙක් වූ කාලය තුළ දී විනාශ කරන ලද පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් මියගිය පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත (iii) හි සඳහන් විනාශ වූ දේපළ පිළිබඳ තක්සේරුවක් කර තිබේද;

(vi) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1307/’16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ පිහිටි, මධ්‍යම රජයට අයත් මාර්ග කිලෝමීටර් ප්‍රමාණය කොපමණද;

(ii) එය මාර්ග සංවර්ධන අධිකාරියේ ශ්‍රේණිගත කිරීම්වලට අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වර්ෂ 2013 සිට 2016 දක්වා මාතර දිස්ත්‍රික්කයේ කාපට් අතුරා ඇති මාර්ග කිලෝමීටර් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2013 සිට 2016 දක්වා මාතර දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධනයට හා නඩත්තුවට වෙන් කරනු ලැබූ මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1317/’16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි රාජ්‍ය ආයතන සතු ඉඩම් ප්‍රමාණය කවරේද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචිකරුවන් විසින් රජයේ ඉඩම් ප්‍රදාන/බලපත්‍ර මත ලබා ගැනීම සඳහා අයදුම් කර තිබේද;

(iii) එසේ නම්, එම අයදුම්පත් ප්‍රමාණය කොපමණද;

(iv) එම අයදුම්කරුවන්ට මේ දක්වා ප්‍රදාන/බලපත්‍ර මත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1326/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලන්දේසි පාලන සමයේදී රාජද්‍රෝහීන් ලෙස නම් කළ ශ්‍රී ලාංකිකයන් කවුරුන්ද;

(ii) ඔවුන් රාජද්‍රෝහීන් ලෙස නම් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රාජද්‍රෝහියෙකු ලෙස නම් කළ පසු ඔහුට අහිමි වන වරප්‍රසාද කවරේද;

(ii) එම වරප්‍රසාද අහිමි වීම ඔහුගේ පවුලේ අයට බලපාන්නේද;

(iii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ලන්දේසීන් රාජද්‍රෝහීන් ලෙස නම් කළ ශ්‍රී ලාංකිකයන් එම ලේඛනයන්ගෙන් ඉවත් කිරීමට කටයුතු කර තිබේද;

(ii) ඔවුන් ජාතික වීරයන් ලෙස නම් කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1383/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 147 අනුව, මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 50/= දක්වා වැඩි කිරීමෙන්, රාජ්‍ය අය භාරයට වූ දායකත්වය කවරේද;

(ii) 1977 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ප්‍රමාණය සහ එහි ආනයන වටිනාකම එක් එක් වර්ෂය අනුව කවරේද;

(iii) රේගු දත්ත අනුව, ශ්‍රී ලංකාවට මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය කරනු ලබන ආනයනකරුවන්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iv) ශ්‍රී ලංකාවට මාළු ආනයනය කිරීම අඩු කිරීම සඳහා රජයට කිසියම් වැඩ පිළිවෙළක් තිබේද;

(v) එසේ නම්, එය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1546/'17

ගරු විමලවීර දිසානායක මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර, කල්මුණේ පාර, ඉන්ධන පිරවුම්හල ඉදිරිපිට පදිංචි ඩබ්ලිව්. ජී. සිරිල් පෙරේරා මහතා එම ලිපිනයෙහි වසර 17ක් අඛණ්ඩව පදිංචිවී සිටින බවත්;

(ii) එම ඉඩම් කොටස සඳහා නීත්‍යානුකූල හිමිකම ලබා ගැනීමට දිගුකාලීනව කරන ලද ඉල්ලීමට අනුව අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් චක්‍රලේඛ අංක 2008/4 අනුව පවත්වන ලද ඉඩම් කච්චේරියකින් පර්චස් 20ක ඉඩම් කොටසක් ඔහුට ලබාදීමට නිර්දේශ වූ බවත්;

(iii) එහෙත්, එම ඉඩම් කොටස විවිධ හේතු දක්වමින් ලබා නොදීම සම්බන්ධයෙන් ඔහු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට කරුණු ඉදිරිපත් කිරීමෙන් පසු, එම කොමිසම විසින් සිදු කරන ලද විමර්ශනය අවසානයේදී ඒ මහතා පදිංචි ඉඩම නීත්‍යානුකූලව ඔහුට ලබාදීමට නිර්දේශ කරනු ලැබූ බවත්;

(iv) නමුත්, මේ දක්වා ඔහුට එම ඉඩමේ අයිතිය ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) පෙරේරා මහතාට සිදුවී ඇති මෙම අගතියට සහ අසාධාරණයට සහනයක් සලසා දීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1043/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩල වාර්ෂික සැසිය සඳහා ජනාධිපතිතුමාගේ සංචාරයට සහභාගි වූ දූත පිරිස කොපමණද;

(ii) උක්ත සංචාරයට සහභාගි වූ පුද්ගලයන්ගේ නම් සහ ඔවුන් දූත පිරිසට ඇතුළත් වූ පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සංචාරය සඳහා රජය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම් විසින් දැරූ සම්පූර්ණ පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1261/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට මුලතිව් දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබූ පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොලිස් ස්ථානයන්හි සේවය කරන ලද පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983 න් පසුව 2009 වර්ෂයේ යුද්ධය අවසන් වන තෙක් වූ කාලය තුළ දී විනාශ කරන ලද පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් මියගිය පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත (iii) හි සඳහන් විනාශ වූ දේපළ පිළිබඳ තක්සේරුවක් කර තිබේද;

(vi) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1308/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මහතා ඝාතනය කරනු ලැබුවේ තමා බවට පාපොච්චාරණයක් සටහන් තබමින් කෑගල්ල ප්‍රදේශයේ විශ්‍රාමික බුද්ධි අංශ සාමාජිකයෙකු දිවිනසාගෙන ඇති බවට වාර්තා පළවී ඇති බවත්;

(ii) එය දිවිනසා ගැනීමක්ද; නැතහොත්, ඝාතනයක්ද; යන්න පිළිබඳ සැක සහිත බව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යවරයා විශේෂ මාධ්‍ය හෙළිදරව්වක් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී විශ්‍රාමික බුද්ධි අංශ සාමාජිකයාගේ මරණය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, වෛද්‍ය නිගමනය කවරේද;

(iii) සිදුවී ඇත්තේ සිය දිවිනසා ගැනීමක් නොවේ නම්, මරණයට අදාළ වූ හේතූන් කවරේද;

(iv) එයට වගකිවයුත්තන්ට එරෙහිව ගනු ලැබූ නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වගකිවයුතු පුරවැසියෙක් වශයෙන් නියෝජ්‍ය අමාත්‍යවරයා කර ඇති ප්‍රකාශය පිළිබඳ යම් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(ii) මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මහතාගේ ඝාතනය පිළිබඳ පරීක්ෂණයේ වත්මන් තත්ත්වය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1328/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ඇති සුළං විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලාගාරයන්ගෙන් විදුලි ඒකකයක් ලංකා විදුලිබල මණ්ඩලය ලබා ගන්නා මිල, එක් එක් බලාගාරය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම බලාගාර අතරින් සී/ස එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගමට අයත් බලාගාර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අලිමංකඩ ඉදිකරන නව සුළං බලාගාරයෙන් ලංකා විදුලිබල මණ්ඩලයට විදුලි ඒකකයක් ලබාදෙන මිල කවරේද;

(ii) සුළං බලාගාරයන්ගෙන් විදුලිය ඒකකයක් අඩුම මිලකට ලබා ගැනීමට රජය පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1384/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 146 යෝජනාවට අනුව, දේශීයව මාළු ටින් කිරීම සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම සඳහා ලක් සතොසට රුපියල් මිලියන 300ක ප්‍රතිපාදනයක් ලබා දුන්නේද;

(ii) මෙම දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබාදිය හැකි ටින් මාළු නිෂ්පාදකයන් කවුරුන්ද;

(iii) ඉකුත් වසර කිහිපය තුළ ඔවුන්ගේ වාර්ෂික ටින් මාළු නිෂ්පාදනය කවරේද;

(iv) වර්ෂ 1977 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ ටින් මාළු ප්‍රමාණය සහ ඒ වෙනුවෙන් වැය කළ විදේශ විනිමය ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) රජය විසින් ටින් මාළු සඳහා නියම කර ඇති රු.125/=ක පාලන මිල වෙළඳපොළ තුළ එලෙසින් ක්‍රියාත්මක නොවන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— උතුරු පළාත් සංචාරක අධිකාරිය ප්‍රඥප්ති කෙටුම්පත,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 46 අ (3) (අ) සහ (ආ) හි විධිවිධානවල කුමක් සඳහන් වුවද, කථානායකතුමා විසින් 2017 මැයි මස 03 වන දින යොමු කරන ලද උතුරු පළාත් සංචාරක අධිකාරිය ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳව, ස්වකීය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව 2017 ජූලි මස 03 වැනි දින දක්වා දීර්ඝ කළ යුතුය.

2.

ගරු විමලවීර දිසානායක මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— දිවිනැගුම පනත යටතේ නියෝග,—2017 අංක 2 දරන පනතින් සංශෝධිත 2013 අංක 1 දරන දිවිනැගුම පනතේ 42 වගන්තිය යටතේ සහ එකී පනතේ 25(2) සහ 29(2) වගන්ති සමඟ කියවිය යුතු, 42 වගන්තිය යටතේ සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 07 දිනැති අංක 2009/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*2.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16(1) වගන්තිය මඟින් කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටු කරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2016.11.24 දින සිට නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධූරයේ රාජකාරි කළ ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා පත් කර ඇති හෙයින්ද;

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතාට පෞද්ගලික වන සේ අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප හා රජයේ නිල නිවාසයක් ලබා දී නොමැති නම්, නිවාස කුලී දීමනාව ඇතුළු සියලු දීමනා (දුරකථන දීමනාව සහ ඉන්ධන දීමනාව හැර) ලබාදීමටත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව සහ ඉන්ධන දීමනාව 2016.11.24 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද;

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 මාර්තු 08) [1].

*5.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදේශ විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග,— 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ජාතික ක්‍රීඩා සංගම් සම්බන්ධයෙන් ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 1990/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ 2017 පෙබරවාරි 13 දිනැති අංක 2006/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 321 වගන්තිය යටතේ බහාලුම් දළ ස්කන්ධ සත්‍යායන සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 අගෝස්තු 11 දිනැති අංක 1979/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.02.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

13.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

14.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

15.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

16.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

17.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

18.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

19.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

925/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පියදාස කුඩා බාලගේ නමැත්තා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හා ඊට අනුබද්ධ ආයතනවල දැරූ තනතුරු කවරේද;

(ii) එම තනතුරු දරන ලද කාල සීමාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔහුගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iv) ඔහු එක් එක් තනතුර සඳහා ලබාගත් මාසික වැටුප් හා දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?